# ආරක්ෂක අමාත්‍යාංශය

## ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO)

# පුරප්පාඩු

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ පහත සඳහන් තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

## උපදේශක ඉංජිනේරු

**ව්‍යුහාත්මක ඉංජිනේරු පර්යේෂණ සහ ව්‍යාපෘති කළමනාකරණ අංශය (SER&PMD) තනතුරු 01 (එක් වසරක කාලයක් සඳහා)**

**තනතුරෙහි සාරාංශය :**

ගොඩනැගිලි පිළිබඳ විමර්ශනය කිරීම, ප්‍රතිකර්මාත්මක පියවර තීරණය කිරීම, ප්‍රතිසංස්කරණය/කඩා දැමීම සහ ගොඩනැගිලිවල තත්ත්ව වාර්තා සහ හානි තක්සේරු කිරීම් සැකසීම සඳහා විශේෂඥ මගපෙන්වීම ලබාදීම.

**සුදුසුකම් :**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ඉංජිනේරු ප්‍රථම උපාධිය

**සහ**

2. ව්‍යුහාත්මක ඉංජිනේරු සැලසුම් නිර්මාණ පිළිබඳ පශ්චාත් උපාධිය හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ පූර්ණ සාමාජිකත්වය

**සමග**

සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 12 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

**පොදු කොන්දේසි :**

තෝරාගැනීම අධ්‍යාපන පසුබිම, පළපුරුද්ද සහ යෝග්‍යතාවය මත සිදු කෙරේ.

මෙය 1 වසරක කාලයක් සඳහා වූ පූර්ණ කාලීන උපදේශන තනතුරකි.

**වැටුප** : සාකච්ඡා කළ හැක.

**වයස් සීමාව** : අවුරුදු 45 ට නොඅඩු සහ අවුරුදු 60 ට නොවැඩි විය යුතුය. රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. සම්පූර්ණ ජීව දත්ත තොරතුරු සහිත අයදුම්පත් අදාළ සහතිකවල පිටපතක් ද සමග දින14 ක් ඇතුළත පහත අත්සන් කරන අය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය,**
**99/1, ජාවත්ත පාර, කොළඹ 05.**